**සුරාබදු තැගි අරමුදල - 2013**

**---------------------------------**

සුරාබදු තැගි අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1912 අංක 8 දරන සුරාබදු ආඥා පනතේ 58 ඒ වගන්තිය යටතේ පලකළ 1994 මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 1(iii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සුරාබදු තැගි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පනාදරගම පුහුණු පාසලේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් රු.47,134,000ක් වයඹ පළාත් සභාවට ගෙවා තිබූ අතර 2013 දෙසැම්බර් 31 දිනට එයින් වැයකර තිබූ වියදම රු.7,939,265ක් විය. පළාත් සභාව වියදම් කල මුදල කෙරීගෙන යන වැඩ (නොනිමි වැඩ) ලෙස සහ ඉතිරි මුදල අත්තිකාරම් ගෙවීම් ලෙස ගිණුම්ගත කල යුතු වුවත්, එසේ කිරීමකින් තොරව මුළු මුදලම ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශුද්ධ වටිනාකම රු.5,880 ක් වූ වාහනයක් සමාලෝචිත වර්ෂයේදී රු.1,428,000 කට විකුණා තිබූ නමුත්, විකිණීමෙන් වූ ලාභය සැලකිල්ලට නොගෙන වත්කමේ ශුද්ධ අගය තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණි. වත්කම් විකිණීමෙන් ලද සම්පූර්ණ මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.

#### 2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය | දුම්කොළ බදු පනත යටතේ අය කරනු ලබන දඩ මුදලින් සියයට 25 ක් තැගි මුදල් ගෙවීමට හිමිකම් ලබන අතර, ඒ සඳහා පනතේ 17 (ii) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් යෝජනා කරන ක්‍රමයක් අනුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ පවතින තැගි අරමුදලක් ස්ථාපිත කර ගත යුතු වුවද, එසේ සිදු නොකොට දුම්කොළ දඩ මුදල් ලැබීම් සහ ත්‍යාග සඳහා ගෙවීම් සුරාබදු තැගි අරමුදල යටතේ ගිණුම්ගත කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 756 | රු.70,809,884 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට භෞතික සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) 1978 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සුරාබදු තැගි අරමුදලෙන් මිලදී ගෙන තිබූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය ප්‍රතිඵල

### 3.1 මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතු වලින් රු.44,957,705ක ශුද්ධ අතිරික්තයක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.19,769,754 ක ශුද්ධ අතිරික්තයක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.25,187,951 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී අරමුදලට සමස්ත ගාස්තු ලැබීම් ප්‍රමාණය රු.28,180,492 ක ප්‍රමාණයකින් හෙවත් සියයට 27 ක වැඩි වීමක් සිදු වී තිබීම අතිරික්තයේ වැඩිවීමට මූලිකව බලපා තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 6,420 ක් මඟින් රු.129,143,113 ක ආදායමක් උපයා තිබූ අතර,ඉකුත් වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 4,793 ක් මඟින් රු.99,161,671 ක ආදායමක් උපයා තිබුණි. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්මික අපරාධ වැටලීම් ආදායම රු.29,981,442 ක් හෙවත් සියයට 30 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 4.5 වගන්තිය ප්‍රකාර ක්‍රීඩා, විනෝද හා සුභ සාධන වැඩවලට රු.50,000 ක්ද, නිර්හීත ක්‍රියා හෝ විශේෂ පිළි ගැනීම් කටයුතුවලට රු.200,000 ක්ද සමාලෝචිත වර්ෂය තුළ වෙන් කර තිබුණද, 2013 වර්ෂය තුළ වාර්තා වූ එවැනි ක්‍රියා සඳහා අරමුදලින් ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 5.2 වත්කම් කළමනාකරණය

ස්ථාවර වත්කම් වෙනුවෙන් වාර්ෂිකව ක්ෂය කරනු ලබන මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ අංක 6000/0000/00/0008/0051/000 දරන ක්ෂය සංචිත අරමුදලට බැර කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.5,992,438 ක් වූ ස්ථාවර වත්කම් මිලයට ගැනීමේදී එම ක්ෂය සංචිත අරමුදල භාවිතා කිරීමකින් තොරව සුරාබදු ත්‍යාග අරමුදලින් පමණක් ගෙවීම් කර තිබුණි.

## 5.3 අවිධිමත් ගනුදෙනු

පනාදරගම පුහුණු පාසල් නේවාසිකාගාර ගොඩනැගිල්ල හා පරිගණක ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සුරාබද්දු තැගි අරමුදලෙන් වයඹ පළාත් සභාවට සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු මුදල පිළිවෙලින් රු.37,940,000 හා රු.9,194,000 ක් වන අතර, ඉදි කිරීම් සඳහා වැය කිරීමෙන් පසු ඉතිරි වී තිබුණු රු.5,037,226 ක මුදල ආපසු ලබා ගැනීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5.4 කළමනාකරණ දුර්වලතා

1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය අනුව, පිහිටුවනු ලැබූ "සුරාබදු තැගි" අරමුදලින් සුරාබදු නිලධාරීන්, තොරතුරු සපයන්නන් සහ වෙනත් අයට තැගි ගෙවීම් සඳහා වූ අනුමත ලිඛිත ක්‍රමවේදයක් 2013 දෙසැම්බර් 31 දිනටද අරමුදල විසින් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) දුම්කොළ බදු පනත යටතේ වූ තැගි අරමුදල ස්ථාපනය කිරීම

(ඇ) වත්කම් පාලනය